06. *අයදුම්කළ යුතු ආකාරය :*

6.1 මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදාසිවල අයදුම්පත සකස් කර 2018.08.13 දිනට පෙර "ලේකම්, හක්මන ප්‍රාදේශීය සභාව, හක්මන." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

6.2 අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙලවරේ අයදුම් කරන තනතුර ඉතා පැහැදිලිව සඳහන් කළ යුතුය. ("................... තනතුර සඳහා අයදුම්පත")

6.3 දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

6.4 අසම්පූර්ණ, අපැහැදිලි මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ද කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6.5 අයදුම්පත සමඟ පහත සඳහන් ලියකියවිලිවල සහතික කරන ලද පිටපත් එවිය යුතුය :-

(i) උප්පැන්න සහතිකය.
(ii) අධ්‍යාපන සහතිකය.
(iii) පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම සේවා සහතිකය.
(iv) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපත.
(v) මෑතකදී ලබා ගත් චරිත සහතික 02 ක්.
(vi) වසර 03 ට වැඩි පලපුරුද්ද පිළිබඳ සේවා සහතිකය.

07. අයදුම්පත් කැඳවූ පසු හෝ කැඳවන අතරතුරේදී හෝ/හා බඳවා ගැනීම ප්‍රමාද කිරීම හා මෙම නිවේදනය වෙනස් කිරීම සංශෝධනය කිරීමේ බලය හක්මන ප්‍රාදේශීය සභාවේ සභාපති සතු වේ.

වී. පී. කේ. අනුරාධ ප්‍රේමරත්න,
සභාපති,
හක්මන ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 02 වැනි දින,
හක්මන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

ආදර්ශ අයදුම්පත

**හක්මන ප්‍රාදේශීය සභාව**

01. අයදුම්කරුගේ මුලකුරු සමඟ නම :——————————.

02. මුලකුරු වලින් හැඳින්වෙන නම :——————————.

03. ස්ථිර ලිපිනය :——————————.

04. උපන් දිනය :——————————

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවු :————. මාස :————. දින :————.

05. ජාතික හැඳුනුම්පත් අංකය :——————————

06. ස්ත්‍රී/ පුරුෂ භාවය :——————————

07. විවාහක/ අවිවාහක බව :——————————

08. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචි වීමෙන්ද? :——————————

09. අධ්‍යාපන සුදුසුකම් :——————————

10. සේවා පලපුරුද්ද :——————————

11. වෙනත් සුදුසුකම් :——————————

12. ඔබ කවරදාක හෝ චෝදනාවක් ලබා උසාවියෙන් වරදකරු වී තිබේද? :——————————

13. ඔබ දැනට මෙම ප්‍රාදේශීය සභාවේ සේවයේ යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර :——————————

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව ට මෙම තනතුරට තෝරා ගැනීමට පෙර හා පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දන්වමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

(දැනට සේවයේ නියුක්ත වූවන්ට පමණි.)

................................................................................ මයා/මිය./මෙනවිය මෙම ආයතනයේ/කාර්යාලයේ ............................................ලෙස සේවය කරන බවත්, ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, සහතික කරමි.

————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————————.

07-718